සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය 2018
இரண்டாம் தவணைப் பரீட்சை 2018
Second Term Test 2018

11 ශ්‍රේණිය
தரம் 11
Grade 11

සිංහල සාහිත්‍ය රසාස්වාදය
Sinhala Literature

පැය තුනයි
( )மணித்தியாலம்
Three Hour

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්ත වේ
- 1 කොටසෙහි 1, 2 ප්‍රශ්නවලටත් 11 කොටසෙහි 3 වන ප්‍රශ්නයටත් 111 කොටසෙහි 4,5,6,7, ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න.

1 කොටස

1 i සිට v තෙක් ඇති කොටස් කියවා ඒ එක එකක් පිළිබඳව අසා ඇති (අ) (ආ) ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

i "මා රාජ්‍යය කරමින් සිටිය දී අන්‍යායක් කරන කෙනෙක් නැත්තාහ කුමක් නිසා මොරගවුදැ'යි...."

(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(ආ) එසේ ඇසීමට බලපෑ හේතුව කුමක් ද?

ii "නපුරු කලට සතහට පැමිණෙන ............ වෙහෙස
එදුරු නොවෙයි කළ කම් පල දෙවා ............ මිස"

(අ) මෙහි ඉතිරි පාද දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මෙම පද්‍යය උපුටාගත් කෘතිය කුමක් ද?

iii (අ) වෙසක් පහන කෙටි කතාව උපුටාගත් කෘතිය කුමක් ද?
(ආ) එහි රචකයා කවරෙක් ද?

iv (අ) සිංහල සාහිත්‍යයේ පළමු උපදේශ කාව්‍යය කුමක් ද?
(ආ) එය රචනා වූයේ කවර යුගයක ද?

v "ම පුතනුවෝ කලට පිනෙ මල් පිපී මුත් නොවන්නා සේ බුදු වුවොත් මුත් නොමියෙති"

(අ) මෙය කාගේ ප්‍රකාශයක් ද?
(ආ) මෙම පාඨය ඇතුළත් කෘතිය කුමක් ද? ( ලකුණු 4×5= 20 යි)

2 පහත සඳහන් පැදි පෙළ කියවා අසා ඇති ප්‍රශ්න උපයෝගී කොටගෙන රසාස්වාදයක් ලියන්න

ඉරට ඉරක් නැත මෙහෙම ඉරක් නැත ඉරිදා පායන ඉර වාගේ
සඳට සඳක් නැත මෙහෙම සඳක් නැත සඳුදා පායන සඳ වාගේ
දියට දියක් නැත මෙහෙම දියක් නැත කැලණි ගඟේ දියවර වාගේ
කෙතට කෙතක් නැත මෙහෙම කෙතක් නැත ගොයම් නෙළන මේ කෙත වාගේ

ලස්සන හිමවතේ මා වී පැසෙන්නේ
දුක් දෙන අලි ඇතුන් පන්නා හරින්නේ
රැක්මෙන දෙවියනේ වෙල බත් බුදින්නේ
දුප්පත් කම නිසයි මම පැල් රකින්නේ

බෝඹු ඉදල දළු ලාදෝ නොලාදෝ
කෙකටිය මලේ වක යාදෝ නොයාදෝ
කැලණි ගඟේ ඔරු යාදෝ නොයාදෝ
කළුගෙ නඟා මෙහි ඒ දෝ නොඒදෝ

කන්ද උඩින් එන කිකිළිය ගෝමරියේ
නළල් වටින් එන දාඩිය මුතු කැටියේ
අත පා මුදු පය පා මුදු වයිරොඩියේ
මට පිටුපා ගෙට යනවද සුරතලියේ

අල්ලා ගෙන නෙරිය අතකින් කිම්ද නගෝ
වසා ගෙන දෙතන අතකින් කිම්ද නගෝ
හිමියෙක් නැති ගමන් තනි මග කිම්ද නගෝ
අම්බලමේ ඉඳලා අපි යම් ද නගෝ

බඩගිනි වෙලා මා ගිය කළ පුතුගෙ ගෙට
මැනලා වී දෙකක් දුන්නයි මල්ලකට
ගන්දෝ නොගන්දෝ කියලා සිතුනි මට
මැනලද පුතේ කිරි දුන්නේ මම නුඹට

දොඩම් කපාලා ඇඹුල් තනාලා නාන්න යන හැටි බලන් කලූ
සේලේ ඈඳලා නෙරිය තියාලා මිදුලේ සක්මන් කරයි කලූ
දහසක් දීලා වළලු තනාලා දෑතේ අතලා බලයි කලූ
දුනුකේ මල සේ මහ ගෙයි ඇඳ පිට ඔළිඳ කෙළින සැටි බලන් කලූ

ලත් පමණට මැටි ඉඳි කරවා ගෙන
පත් බැඳලා කළ ගෙඩි තනවා ගෙන
අත් නෑරම කළ ගෙඩි තෝරා ගෙන
සිත් සතොසින් කළ පිඹිනව වෙන වෙන

යසසින් වැඩි පත්තිනි කඳ තෙදිනේ
නුවරට ළඟ පස් නිරිඳුගෙ උයනේ
වට කොට දස දහසක් පිරිවරිනේ
අකලට අඹයක් පල ගති උයනේ

i මෙම කවි කුමන වර්ගයට අයත් දැයි විස්තර කරන්න.

ii මේ එක් එක් කවිවලින් කියැවෙන විවිධ ජීවන වෘත්තීන් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

iii ජන කවි නිර්මාණයේදී ජීවන වෘත්තීන් පමණක් නොව විවිධ සමාජ සිද්ධීන් ද යොදා ගෙන ඇති ආකාරය දක්වන්න.

iv මෙහි ඇතැම් කවි ධ්වනිතාර්ථවත් යෙදුම් වලින් යුක්ත බව විග්‍රහ කරන්න.

## 11 කොටස

- මෙම කොටසින් ප්‍රශ්න එකකට පමණක් පිළිතුරු සපයන්න.

3 පහත සඳහන් ගද්‍ය හා පද්‍ය කොටස් දෙකෙන් එක කොටසකට පමණක් පිළිතුරු සපයන්න.

අය්යා විශාල කූඩුවෙහි ඉටිපන්දම් දල්වා අතුවල කූඩුවල ද ඉටිපන්දම් දල්වන්නට විය. දැල් වූ ඉටිපන්දමක් අතෙහි ඇතිව සිටි මට කුඩාම කූඩුවක ඉටිලන්දම දැල්වීමට සිතුණේ ය. මම අය්යාට නොදන්වා කූඩුවක ඉටිපන්දමක් දැල්වූවෙමි. මා තවත් කූඩුවක ඉටිපන්දමක් දැල්වීමට තැත් කරන විට එහි කඩදාසි පටියට ගිනි ඇවිලිණි කටින් පිඹ එය නිවීමට මා කළ උත්සාහය සාර්ථක නොවී ය.

කඩදාසි පටියෙන් කුඩුවට ගිනි ඇවිලුණේ ය. මම බියපත් වී කෑගසන්නට වීමි. මට මඳක් ඈතින් සිට කිරා ගිනි ගත් කුඩුව නිවීමට දිව ආ නමුත් ඔහුට එය වහා කළ නොහැකි විය. ඒ කුඩුවෙන් කුඩුවකට ගිනි ඇවිලුණේ ය.

එවිට අය්යා දිව අවුත් ගිනි ගත් කුඩු සෙසු කුඩු අතරින් වෙන් කිරීමට උත්සාහ කළේ ය. අය්යා නැඹුරු වී කුඩුවක් මහ කුඩුවේ අත්තකින් වෙන් කිරීමට තැත් කරන විට ඔහු ඇඳ සිටි බැනියමෙහි අතට ගිනි ඇවිලුණේ ය. ඔහු කුඩු අතරින් මෑත්ව අනික් අතින් ගසමින් බැනියමේ අත නිවීමට තැත් කළ නමුත් ඔහුට එය නිවා ගන්නට නොහැකි වි ය. අය්යාගේ බැනියමට ගිනි ඇවිලෙනු දැක අප කෑ ගසන ශබ්දය අසා අම්මාත් තාත්තාත් ගෙයි සිට දිව ආහ.

තාත්තා අය්යාගේ බැනියම ඉරා ඉවත් කළේ ය. අප අය්යාගේ බැනියම් අත නිවීමට තැත් කරන අතර ගිනිගත් කුඩුවකින් ගින්න පැතිරීමෙන් විශාල කුඩුව ද ගිනි ගත්තේ ය. ඊට පසු කුඩු නිවීමට කිසිවෙක් වෙහෙස නොවී ය.

අය්යාගේ බැනියමට ගිනි ඇවිලුණු විට නංගීත් මමත් ආම්භ කළ ඇඬුම අපි නොනැවැත්වීමු. අය්යාගේ අත පිළිස්සී තිබුණු හෙයින් ඔහු දොස්තර ගෙදරට ගෙන යා යුතු යයි තාත්තා කීවේ ය. අත පිළිස්සීම නිසා අය්යා මිය යා හැකියි මා තුළ බියක් ද ශෝකයක් ද ඇති විය පහනට ගිනි ඇවිලුණේ මා අතින් බව සිහිවීම මගේ ශෝකය තවත් වැඩි වීමට හේතු විය.කිරා අපේ බක්කි කරත්තය මිදුලට ගෙනාවේ ය. තාත්තා අය්යා කරත්තයේ නංවා දොස්තර ගෙදරට ගෙන ගියේ ය.

පහනට ගිනි ඇවිලුණේ මා අතින් බව අම්මා දත් නමුත් ඈ මට බැනීමට නොසිතුවා ය. ඈ එසේ නොකළේ බියපත් වී සිටි මා තවත් බිය ගැන්වීමට නුසුදුසු යැයි සිතූ හෙයිනැයි හඟිමි. හඬමින් සිටි නංගී නිශ්ශබ්දව සිටි අම්මාට තුරුලු වී නිදා ගත්තා ය.

i. මෙම ගද්‍ය පාඨයෙන් කියැවෙන සිදුවීම් තුනකින් පමණ ලියන්න (ල.4)

ii මෙම සිදුවීම් නිසා කලබලයට පත් වන කථකයා හැසිරුන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ල.6)

iii අවස්ථාවට උචිත අයුරින් මව හැසිරෙන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ල.7)

iv මෙම සිදුවීම් චිත්ත රූප මැවෙන ආකාරයට ඉදිරිපත් කිරීමට කතුවරයා සමත් වී ඇති ආකාරය කෙටියෙන් විග්‍රහ කරන්න. (ල.8)

නැතහොත්

නැගෙතත් අවර ගිරගින් දිනකර මඬල
සැලෙතත් සුනෙර පවනින් සෙදෙතත් අනල
පිපෙතත් ගිරි මුදුන හෙල් මැලි පියුමුපුල
බොරු නැත්තෙමය මහතුන් පැවසූ තෙපුල

කොතෙක් වෙහෙස ලදුවත් සුදනෝ පවර
උදක් ලොව සතුන් සිත දුක් කෙරෙති දුර
පසක් රාහු මුවපත් වෙමිනි බියකර
අනික් පසින් ලොව හෙළි කෙරෙති හිමකර

පින් දමද පුතුන් සියයක් ලදුවත් නිසරු
ගුණ නැණ බෙලෙන් යුතු පුතුමය ඉතා ගරු
එක පුන් සඳින් දුරුවෙයි ලොව ගන අඳුරු
නෙක තරු රැසින් එලෙසට නොම වේය දුරු

i මෙම කවි නිර්මාණය කිරීමේ ප්‍රධාන අරමුණ පේළි තුනකින් ලියන්න (ල. 4)

ii කාව්‍ය නිර්මාණය සඳහා ස්වභාවික වස්තූන් යොදා ගෙන ඇති අයුරු කෙටියෙන් ලියන්න. (ල. 6)

iii මෙම පද්‍යය තුළින් ලබා දෙන උපදේශය පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න (ල. 7

iv යොදා ගෙන ඇති උපමා කොතෙක් දුරට ගැළපේ දැයි කෙටියෙන් විග්‍රහ කරන්න (ල. 8)

(ලකුණු 25 යි)

## 111 කොටස

- මෙම කොටසින් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න

4 "කුස ජාතකය තුළින් මනුෂ්‍ය චිත්ත ස්වභාවය මැනවින් නිරූපණය වේ." උදාහරණ තුනක් දෙමින් මේ පිළිබඳ සාකච්ඡා කරන්න

(ල. 15)

5 කෙටිකතා ලක්ෂණ පිළිබඳ අවධානය යොමු කරමින් "වෙසක් පහන" කෙටි කතාවේ එම ලක්ෂණ කොතෙක් දුරට අන්තර්ගත වේ දැයි කෙටි කතා ලක්ෂණ 3ක් දක්වමින් විමසීමක් කරන්න (ල. 15)

6 "විවිධ මිනිස් දුර්වලතා මගහරවා ගැනීමට වටිනා උපදේශ ලබා දීම සඳහා නිර්මාණය කළ කාව්‍ය සංග්‍රහයක් ලෙස සුභාෂිතය හැඳින්විය හැකි ය." උදාහරණ 3 කි වෙමින් මෙම කියමන විග්‍රහ කරන්න

(ල. 15)

7 වඩාත් රසවත් කතා පුවතක් ඉදිරිපත් කිරීම සඳහා ධර්මසේන හිමියන් යොදා ගන්නා භාෂා උපක්‍රමයන් නන්ද තෙරුන්ගේ වස්තුව ඇසුරෙන් උදාහරණ 3 ක් දෙමින් සාකච්ඡා කරන්න. (ල. 15)